**ශීර්ෂය - 298 මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.1. හා 1.6.5 ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ අනුව පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 07 වන ඡේදයේ (vi) වගන්තිය අනුව මූල්‍ය කාර්ය සාධන වාර්තාව අනුව වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයට පියවිය යුතු හෝ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු වටිනාකම හා මුදල් පොතට අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු අගය අනිවාර්යෙන්ම වෙනස් අගයක් ගන්නා බැවින් එම ශේෂය සැසඳීම සඳහා අක්මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල කළයුතු වුවද එසේ අග්‍රිම ගැලපුම් ගිණුමක් සකස් කර නොතිබුණි. එලෙස අග්‍රිම ශේෂය පරීක්ෂා කිරීම සඳහා අග්‍රිම ගැලපුම් ගිණුමක් ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම්වල නිවැරදිභාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වීම. | 2020 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරමි. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස හඳුනා ගත යුතු වටිනාකම දෙපාර්තමේන්තුවේ විස්තරාත්මක ශේෂ පිරික්සුමට අනුව රු. 6,797,291 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.5,326,224 ක් ලෙස දක්වා තිබුණෙන් රු. 1,471,067 ක වෙනසක් විය. | විස්තරාත්මක ශේෂ පිරික්සුමෙහි දැක්වෙන අගය මූල්‍ය ප්‍රකාශයෙහි වෙනත් ආදායම් ලෙස හඳුනාගත යුතු වීම. | ආදායම් ගණන් දීමේ නිළධාරියා දෙපාර්තමේන්තුව නොවන බැවින් ආදායමක් ලෙස ගිණුම් ගත කර නොමැති බව. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනයේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධ ඒසීඒ -5 සටහනෙහි දක්වන ලද අත්තිකාරම් ගිණුම් අංක 298012 අදාලව වර්ෂය තුල හරස් සටහන් මඟින් බැර කිරීම් යටතේ රු. 1,276,350 ක් දක්වා ඇති අතර දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව එම වටිනාකම රු.771,219 ක් වූයෙන් රු.505,130 ක වෙනසක් විය. | හරස් සටහන්වලින් එන බලපෑම සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් අනුව කළ යුතු වීම. | 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ සිට වෙනත් දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීම සඳහා එම එක් එක් දෙපාර්තමේන්තු විසින් මාසික ගිණුම් සාරාංශ මඟින් අත්තිකාරම් ගිණුම් අංක 298012 ට බැර කිරීම් වේ. |

**1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වත්කම් අයිතම 02 කට අදාලව 2019 ජනවාරි 01 දිනට දී ඇති ශේෂයන්, 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල වූ ශේෂයන් සමඟ සැසදීමේදී රු.281,760,544 කින් නොසැසදුණු අතර ඒ බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි වටිනාකම් හෙළිදරව් කළ යුතු වීම. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කරමි. |

**1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව අත්තිකාරම් අයකර ගැනීම් වටිනාකම රු.6,079,011 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම ඇතුලත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අත්තිකාරම් අයකර ගැනීම් හරස් සටහන් ගනුදෙනුවක් බැවින් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා නොමැත. |

**1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | අදාල ප්‍රකාශයන් ඉදිරියේදී ඉදිරිපත් කරනු ලැබේ. |

**1.6.6 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර එම වාර්තා 2020 මාර්තු 17 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කලයුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කරමින් පවතින අතර අවසන් වූ වහාම ඉදිරිපත් කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයය අංක 298-1-1- 2103 යටතේ යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ සඳහා රු.10,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම වටිනාකම සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි. | හැකිතාක් තාත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඇණවුම් කළ උපකරණවලට අදාල ලියවිලි ලැබී නොතිබුණු බැවින් භාණ්ඩාගාරයෙන් අක් මුදල් ඉල්ලුම් නොකරන ලදී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව 2019 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය ඇතුළත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු එවා නැත. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කිරුම් මිනුම් උපකරණ භාවිතා කරන නිෂ්පාදකයින්, වෙළඳුන්, ආනයනකරුවන් හා අළුත්වැඩියා කරුවන් ලියාපදිංචි කිරීම සඳහා බලපත්‍ර 600 ක් 2019 වර්ෂය තුල නිකුත් කිරීමට ඉලක්ක කර තිබුණු අතර ඉන් බලපත්‍ර 548 ක් පමණක් නිකුත් කර තිබුණි. එයින් උපයන ලද ආදායම රු. 134,550 ක් විය. | ඉලක්ක කල ආදායම ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු එවා නැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාජ මිනුම් සම්බන්ධ වැටලීම් 22165 ක් සිදුකර තිබුණු අතර ඉන් සාර්ථක වැටලීම් ගණන 1514 ක් විය. මෙම වැටලීම් වලින් දඩමුදල් වශයෙන් රු. 2,855,350 ක ආදායමක් උපයා ගෙන තිබුණු අතර මුලතිව් හා මන්නාරම් දිස්ත්‍රික්ක වල කිසිදු වැටලීමක් සිදුකර නොතිබුණි. | ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු එවා නැත. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දින වන විට වායු සමීකරණ පද්ධතියක් සවිකිරීම වෙනුවෙන්වූ රු.මිලියන 995 ක ව්‍යාපෘතියක් ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත කර තිබුණද 2020 මැයි 25 වන විටත් විද්‍යාගාරය තුල වායු සමීකරණ පද්ධතිය සවිකිරීම අවසන් කර නොතිබුණි. | ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු එවා නැත. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උපවගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව තිබුණත් 2019 මැයි 31 දින වන විටත් එලෙස කටයුතු කර නොතිබුණි. | 2018 ජුලි 17 දිනැති 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 16(2) උපවගන්තිය අනුව කටයුතු කල යුතු වීම. | ඉදිරියේදී වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබුණද, ඒ සඳහා වන දත්ත රැස්කිරීම සඳහා වන සැලැසුමක් හෝ වැඩ සටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. | නිසි පරිදි කටයුතු කිරීමට අවශ්‍ය වන දත්ත රැස්කර ගැනීම සඳහා ක්‍රමවේදයක් කඩිනමින් ඇති කල යුතු වීම. | ඉදිරියේදී ඉදිරිපත් කරමි. |

**5.** **යහපාලනය**

**5.1** **විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වන වගන්තිය අනුව ගණන්දීමේ නිලධාරි විසින් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් ඊට අදාලවූ කටයුතු ඉටුකර නොතිබුණි. | 2016 ජනවාරි 28 දිනැති අංක ඩීඑම්ජී/2009(i)(i) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2 වන ඡේදය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය අනුව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය**<br>---------------------- | **නිර්දේශය**<br>----------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>-------------- |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක් පුරප්පාඩුව පැවති අතර සමාලෝචිත වර්ෂයේදී එම තනතුරු අතරින් අභ්‍යන්තර විගණක තනතුර හැර සහකාර අධ්‍යක්ෂ තනතුරු 7 ක් හා සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුරක් පුරප්පාඩුව පැවතුණි. ඒ අනුව අනුමත ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 19 අතුරින් තනතුරු 08 ක් පුරප්පාඩුව පැවතීමෙන් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිවීමේ අවධානමක් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් ඉටුකල හැකි වන පරිදි පුරප්පාඩු පිරවීම කෙරෙහි අවධානය යොමු කිරීම. | අදහස් දක්වා නැත. |
| (ආ) | 2019 වර්ෂය අවසන් වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08 ක්ද, තෘතීයක මට්ටමේ පුරප්පාඩු 24 ක්ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 38 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 12 ක්ද විය. එනම් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 22 ක් පිරවීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපා තිබුණි. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත. |